# 2022.03.14 වන දින පෙ.ව. 09.30 ට හපුතලේ ප්‍රාදේශීය සභාවේ නව සභා රැස්වීම් ශාලාවේදී පැවති හපුතලේ ප්‍රාදේශීය සභා මාසික මහා සභා රැස්වීම් වාර්තාව

**පැමිණීම**

1. බී. කන්දසාමි මහතා - ගරු සභාපති
2. වයි.එම්.නිමල් අමරසිරි මයා - ගරු උපසභාපති
3. සෙල්ලයියා සගාදේවන් මයා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
4. ආර්.එම්. ඉන්ද්‍රතිලක රාමනායක මයා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
5. කේ.එම්. විමලසිරි මයා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
6. සවරිමුත්තු ප්‍රභාහර් මයා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
7. මාරප්පන් කන්දසාමි මයා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
8. එච්.ඒ.ඩී. චාන්දනී මානෙල් කුමාරි මිය - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීණී
9. කේ.ඒ. චන්දන කිත්සිරි පෙරේරා මයා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
10. ඊ.එම්. සීගිරි ලංකා ඒකනායක මයා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
11. එල්.එච්. ඉන්දික සම්පත් මයා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
12. එෆ්. වයලට් රෝස් මහත්මිය - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීණී
13. ගෝපාලන් මුරුගන් මයා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
14. ඩී. සුදත් අරුණඅංජන මයා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
15. තංගවේලු මහේන්ද්‍රන් මයා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
16. ජී. ලියෝ කැමිලස් ප්‍රනාන්දු මයා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
17. ආර්.එම්. අනුලාවතී මල්ලිකා මිය - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීණී
18. වේලුසාමි එලීල් අරසි මිය - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීණී
19. ආර්.එල්.සුදර්ශන මහතා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී

## 01.පසුගිය රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම

හපුතලේ ප්‍රාදේශීය සභාවේ 2022.02.11 වන දින පවත්වන ලද මාසික මහ සභාවෙ හි මහ සභා වාර්තාව කියවූවා සේ සළකා සභා සම්මත කිරීම සිදු කරන ලෙස ගරු මූලාසනය විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි ඊ.එම්. සීගිරි ලංකා ඒකනායක මහතා විසින් පසුගිය මහ සභා වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරන ලද අතර, එම යෝජනාව ගරු උප සභාපති වයි.එම්.නිමල් අමරසිරි මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව පසුගිය මහ සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

## 02. සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන

**නැත**

## 03. සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්. විමලසිරි මහතා

- බණ්ඩාරවෙල, එරණවෙල ග්‍රාම සංවර්ධන සමිතිය විසින් බේකරි අපජලය පරිසරයට මුදා හැරීම මේ වන විට නතර කර ඇති බැවින් ඒ සම්බන්ධයෙන් සභාව වෙත ස්තූතිය පුද කර යොමු කර ඇති ලිපිය
- රාජගිරිය , නාවල, ගල්පොත්ත පාර හි පදිංචි වයි.එම්. නිමල් සමරනායක මහතා විසින් ඉබ්බන්ලන්ද වත්තහේන මාර්ගය ගමනාගමනයට බාධාවන පරිදි අවහිර වීම සම්බන්ධයෙන් යොමු කර ඇති ලිපිය

2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ලියෝ කැමිලස් ප්‍රනාන්දු මහතා

- දියතලාව මධ්‍ය මහ විද්‍යාලීය ක්‍රීඩා පිටිය සැකසීමේ දී බැකෝ යන්ත්‍රය එහා මෙහා යාමෙන් අබලන් වී ඇති කොන්ක්‍රීට් පාර අලුත්වැඩියා කිරීම නැවත සිහි කැඳවීම සම්බන්ධයෙන් ගම්වැසියන් විසින් යොමු කර ඇති ලිපිය
- දියතලාව , කොස්ගහ කුඹුර බී.එච්. යසාත් මහතා විසින් නිවසෙහි බිත්තිය කඩා වැටී ඇති බැවින් ඒ සඳහා ද්‍රව්‍යාධාරයක් ලබා දෙන ලෙස යොමු කර ඇති ඉල්ලීම් ලිපිය
- දියතලාව , කොස්ගහ කුඹුර අභියෝග ග්‍රාම සංවර්ධන සමිතිය විසින් කොස්ගහකුඹුර - හෙළවත්ත (ගමේ පාලම) ඉදි කිරීම නවතා දැමීම සම්බන්ධයෙන් යොමු කර ඇති ලිපිය

3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.එම්. අනුලාවතී මල්ලිකා මහත්මිය

- බණ්ඩාරවෙල , කහත්තේවෙල සමගි කාන්තා සංවිධානය විසින් සිංහල හා හින්දු අලුත් අවුරුදු උත්සවය සදහා ප්‍රතිපාදන ලබා ගැනීම සම්බන්ධයෙන් යොමු කර ඇති ලිපිය

4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මාරප්පන් කන්දසාමි මහතා

- හපුතලේ - තොටලාගල දෙමළ කනිටු විදුහලේ විදුහල්පති එම්. සුන්දර රාජා මහතා විසින් එම විද්‍යාලයේ සවි කර ඇති ගේට්ටුව සඳහා ආවරණයක් සාදා දෙන ලෙස යොමු කර ඇති ඉල්ලීම් ලිපිය

5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ප්‍රභාගර් මහතා

- **සිලම්බු** කලාවේ තරඟාවලියකට සහභාගි වී ජයග්‍රහණ ලබා ගත් පාසල් ළමුන් තිදෙනෙක් ඉන්දියාව බලා පිටත්වීම නියමිත බැවින් ඔවුන් සඳහා ආධාර මුදලක් ලබා දෙන ලෙසට ඉල්ලීම් කර යොමු කර ඇති ලිපිය
- කහගල්ල සෙන් සෙබස්ටියන් ක්‍රිස්තියානි පල්ලියේ ඉදි කිරීම් වැඩසටහන සඳහා ද්‍රව්‍යාධාර ලබා දෙන ලෙසට ඉල්ලීම් යොමු කර අති ලිපිය

6. <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. සගාදේවන් මහතා</u>

- ග්ලැනනෝර් හි පදිංචි ජේ.විජේරාණී මහත්මිය විසින් වෛද්‍යාධාරයක් ලබා දෙන ලෙසට යොමු කර ඇති ලිපිය

**04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න.**

නැත

**05. යථා පරිදි කල් දී ඇති යෝජනා**

**යෝජනා අංක 01**

<u>ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා</u>

හපුතලේ ප්‍රාදේශීය සභාවේ 2022 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන කමිටුව සඳහා පහත නම් සඳහන් නිළධාරීන් පත් කර ගැනීම සුදුසු බවත්, අභ්‍යන්තර විගණන කමිටු රැස්වීම් වර්ෂයකට සිවු වරක් පැවැත්වීම සුදුසු බවත් යෝජනා කරන්නී ය.

| | | |
|---|---|---|
| මුදල් සහකාර | - | ඒ.ජී.ආර්. ධර්ම කීර්ති මහතා |
| සංවර්ධන නිලධාරි | - | සුරංග ලක්මාල් මහතා |
| සංවර්ධන නිලධාරි | - | අයන්ති ලෙනෝරා මිය |
| සංවර්ධන නිලධාරි | - | ටී.ජී. නිමල් කුමාර මයා |

<u>ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. සුදත් අරුණ රංජන මහතා</u>

<u>විවාද</u>

හපුතලේ ප්‍රාදේශීය සභාවේ 2022 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන කමිටුව සඳහා පහත නම් සඳහන් නිළධාරීන් පත් කර ගැනීම සුදුසු බවත්, අභ්‍යන්තර විගණන කමිටු රැස්වීම් වර්ෂයකට සිවු වරක් පැවැත්වීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

| | | |
|---|---|---|
| මුදල් සහකාර | - | ඒ.ජී.ආර්. ධර්ම කීර්ති මහතා |
| සංවර්ධන නිලධාරි | - | සුරංග ලක්මාල් මහතා |
| සංවර්ධන නිලධාරි | - | අයන්ති ලෙනෝරා මිය |
| සංවර්ධන නිලධාරි | - | ටී.ජී. නිමල් කුමාර මයා |

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 02**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

වර්තමානයේ පවතින ඉන්ධන හිඟය හේතුවෙන් නගරයට වාහන නොපැමිණීම නිසා පොළ බදු හා වාහන බදු අය කිරීමට අපහසු වූ බැවින් කුලී මුදල් අය කර ගැනීම සම්බන්ධයෙන් සහනයක් ලබා දෙන ලෙසට හපුතලේ ප්‍රාදේශීය සභාවේ පොළ බදු හා වාහන බදු ටෙන්ඩර්කරු වන හපුතලේ , රොහැම්ටන්, අංක 22/1 , ලිපිනයේ පදිංචි කේ. ශාන්ත කුමාර් මහතා විසින් සිදු කර ඇති ඉල්ලීම් ලිපිය මූල්‍ය හා ප්‍රතිපත්ති කමිටුවට යොමු කිරීමෙන් අනතුරුව ඒ සම්බන්ධයෙන් තීරණයක් ලබා ගැනීම සඳහා මහ සභාවට ඉදිරිපත් කිරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල් සුදර්ශන මහතා

විවාද

වර්තමානයේ පවතින ඉන්ධන හිඟය හේතුවෙන් නගරයට වාහන නොපැමිණීම නිසා පොළ බදු හා වාහන බදු අය කිරීමට අපහසු වූ බැවින් කුලී මුදල් අය කර ගැනීම සම්බන්ධයෙන් සහනයක් ලබා දෙන ලෙසට හපුතලේ ප්‍රාදේශීය සභාවේ පොළ බදු හා වාහන බදු ටෙන්ඩර්කරු වන හපුතලේ , රොහැම්ටන්, අංක 22/1 , ලිපිනයේ පදිංචි කේ. ශාන්ත කුමාර් මහතා විසින් සිදු කර ඇති ඉල්ලීම් ලිපිය මූල්‍ය හා ප්‍රතිපත්ති කමිටුවට යොමු කළ අතර ඒ සම්බන්ධයෙන් තීරණයක් ලබා ගැනීම සඳහා මහ සභාවට ඉදිරිපත් කිරීම සුදුසු බවට එහිදී තීරණය වූ බැවින් මෙකී යෝජනාව මහ සභාවට ඉදිරිපත් කළ බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.සුදත් අරුණ රංජන මහතා අදහස් දක්වමින් ප්‍රසම්පාදන ක්‍රමවේදය යටතේ තෝරා ගන්නා ලද සැපයුම්කරුවකු වන බැවින් එකී ගිවිසුම ප්‍රකාරව කුමන හෝ වාතාවරණයක් යටතේ ගිවිසුමේ සඳහන් නීති ප්‍රකාරව සේවය සැපයීමට බැඳී සිටින බවත් සභාව විසින් තීරණය කරනු ලබන කරුණු මත පදනම්ව පමණක් සහන ලබා දීම සුදුසු බවත් කොවිඩ් වසංගත තත්ත්වය යටතේ මින් පෙර අවස්ථාවලදී සහන ලබා දුන් බවත් ප්‍රකාශ කරන ලදී. එසේම පොළ බදු හා වාහන බදු අය කිරීම සිදු කරනු ලබන පුද්ගලයා පහසුවෙන් හඳුනා ගත හැකි වන පරිදි එම පුද්ගලයාට නිල ඇඳුමක් ලබා දීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්. සුදර්ශන මහතා අදහස් දක්වමින් දින කිහිපයකට පෙර සභාව ඉදිරිපිට ඇති අලෙවිසැලෙහි නිවසට පැමිණි ඥාති පිරිසකට අයත් වාහනයකටද බදු අය කළ බවත් එවැනි ක්‍රියා සිදු නොකරන ලෙස එම සේවයෙහි නිරත පුද්ගලයා දැනුවත් කිරීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමන් මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් ගිවිසුම් ප්‍රකාරව විනාඩි 15ක කාලයක් ඉක්මවා නතර කරනු ලබන වාහන සඳහා බදු මුදල් අය කරන බවත් ඒ සම්බන්ධයෙන් විශේෂ සහන සැලසීමක් සිදු කළ නොහැකි බවත් ප්‍රාදේශීය සභාවේ මේ වන තෙක් පොල බදු හා වාහන බදු රැස් කරන ලද පුද්ගලයින්ගෙන් මුදල් රැස් කිරීම් කටයුතු නියම ආකාරයෙන් සිදු කරනු ලබන එකම පුද්ගලයා ඔහු බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එච්. ඉන්දික සම්පත් මහතා අදහස් දක්වමින් පොල බදු හා වාහන බදු රැස් කරන පුද්ගලයා විසින් ඇතැම් අවස්ථාවලදී නගරයේ රථගාල් හි ලියාපදිංචි වාහනවලින්ද බදු මුදල් රැස් කර ඇති බවට තොරතුරු ලැබී ඇති බව ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් රථගාල් හි ලියාපදිංචි ත්‍රී රෝද රථහිමියන් එසේ බදු මුදල් ගෙවීමක් අවශ්‍ය නොවන බවත් අනවසරයෙන් ධාවනය වන ත්‍රී රෝද හේතුවෙන් මෙම ගැටලුව උද්ගත වී ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.සුදත් අරුණ රංජන මහතා අදහස් දක්වමින් ත්‍රී වීල් රථවල සභාව විසින් නිකුත් කරනු ලබන ස්ටිකරය නොමැති නම් එය ලියාපදිංචි ත්‍රී රෝද රථයක් නොවේය යන කරුණ මත එම ත්‍රී රෝද රථ සඳහා බදු මුදල් අය කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. ලියෝ කැමිලස් ප්‍රනාන්දු මහතා අදහස් දක්වමින් ත්‍රී රෝද රථ සංගමයෙන් ද ස්ටිකරයක් නිකුත් කර ඇති බැවින් හඳුනා ගැනීම පහසු බව ප්‍රකාශ කරන ලද අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එච්. ඉන්දික සම්පත් මහතා  අදහස් දක්වමින් සභාව මගින් නිකුත් කරනු ලබන ස්ටිකරය වාහානයේ වීදුරුව පිටුපස පැත්තෙන් ඉදිරියට පෙනෙන පරිදි ඇලවීමට හැකි පරිදි නිකුත් කිරීමට වැඩ පිළිවෙළක් යොදන ලෙස ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර,ගිවිසුම් ප්‍රකාරව බදු මුදල් අය කිරීම සුදුසු බවත් විශේෂ අවස්ථාවන්හි දී සිදු කරනු ලබන ඉල්ලීම් සලකා බලා සභාව විසින් ගනු ලබන තීරණ මත පමණක් පදනම්ව  බදු මුදල් අය නොකර සිටීම සුදුසු බවත් යන තීරණය සඳහා ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 03**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

ශ්‍රී ලංකා නාවික හමුදා සංගමය  විසින් අප වෙත යොමු කරන ලද 2022-03-04 දිනැති ලිපිය ප්‍රකාරව ශ්‍රී ලංකා නාවික හමුදා සංගමය මගින් පවත්වාගෙන යනු ලබන **සිහිනය** නිවාඩු නිකේතනයට පිවිසෙන සුවඳගම ,පොලිස්කන්ද , දියතලාව මාර්ගය ශ්‍රී ලංකා විශ්‍රාමික නාවික හමුදා  සංගමයේ සාමාජිකයන්ගේ ඉල්ලීම පරිදි , **අද්මිරාල් දයා සඳගිරි මාවත**  ලෙස නම් කිරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. චන්දන කිත්සිරි පෙරේරා  මහතා

විවාද

ශ්‍රී ලංකා නාවික හමුදා සංගමය  විසින් අප වෙත යොමු කරන ලද 2022-03-04 දිනැති ලිපිය ප්‍රකාරව ශ්‍රී ලංකා නාවික හමුදා සංගමය මගින් පවත්වාගෙන යනු ලබන **සිහිනය** නිවාඩු නිකේතනයට පිවිසෙන සුවඳගම ,පොලිස්කන්ද , දියතලාව මාර්ගය ශ්‍රී ලංකා විශ්‍රාමික නාවික හමුදා  සංගමයේ සාමාජිකයන්ගේ ඉල්ලීම පරිදි , **අද්මිරාල් දයා සඳගිරි මාවත**  ලෙස නම් කිරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. ලියෝ කැමිලස් ප්‍රනාන්දු මහතා අදහස් දක්වමින් මෙකී මාර්ගය තමා විසින් ඉදි කළ සංවර්ධනය කරන ලද මාර්ගයක් බවත් මෙය පොලීසිය පිටුපස මාර්ගය යන නමින් භාවිතා වන බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.සුදත් අරුණ රංජන මහතා අදහස් දක්වමින් මෙකී මාර්ගය පොලීසිය හා මාර්ග සංවර්ධන අධිකාරිය අතර පිහිටි බැවින් මේ සම්බන්ධයෙන් කුමන හෝ ගැටලුවක් පවතින බවත් මෙකී මාර්ගය ප්‍රාදේශීය සභාවට අයත් මාර්ගයක් ලෙස ගැසට් විය යුතු මාර්ගයක් බවත් මෙය , **අද්මිරාල් දයා සඳගිරි මාවත** ලෙස නම් කරනු ලැබුවහොත් මාර්ගය කැලෑ එළිපෙහෙළි කිරීම, සුද්ධ පවිත්‍ර කිරීම, කානු කැපීම ආදී කිසිවක් කිරීමට සභාවට අවසරයක් නොලැබී යාමට පවා ඉඩ ඇති බව ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්. සුදර්ශන මහතා අදහස් දක්වමින් මීට වසර ගණනකට පෙර කොස්ගහ කුඹුර මාර්ගයේ ක්‍රීඩාපිටිය පිහිටි ස්ථානය මේ වන විට යුධ හමුදාව විසින් වාහනයක් හෝ නතර කිරීමට අවසර ලබා නොදෙන තත්ත්වයට පත් වී ඇති බැවින් මෙකී මාර්ගය ද **අද්මිරාල් දයා සඳගිරි මාවත** ලෙස නම් කරනු ලැබුවහොත් අනාගතයේ දී සභාවට කිසිදු අයිතියක් හිමි නොවීමට ඉඩ ඇති බැවින් මෙකී තීරණය සඳහා දැඩි සේ විරුද්ධත්වය ප්‍රකාශ කරන බව ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, මෙකී මාර්ගය **අද්මිරාල් දයා සඳගිරි මාවත** ලෙස නම් කිරීම සම්බන්ධයෙන් ගරු මන්ත්‍රී මණ්ඩලය විරුද්ධත්වය ප්‍රකාශ කළ බැවින් එකී යෝජනාව ප්‍රතික්ෂේප වූ අතර සභා සම්මත නොවී ය.

**යෝජනා අංක 04**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

2021-11-02 වන දින පැවති මුදල් කමිටු නිර්දේශය මත කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් රජය විසින් ක්‍රියාත්මක කරන ලද සංචරණ සීමා හේතුවෙන් 2021 අගෝස්තු මස 21 වන දින සිට 31 වන දින දක්වා සහ සැප්තැම්බර් මස රට වසා තබන දිනයන් සඳහා අය කළ යුතු පහත උප ලේඛනයේ සඳහන් වූ කඩකුලී රු.8,000.00 ක මුදල සහ බිම් කුලී රු.28,000.00ක මුදල එකී පුද්ගලයන්ගේ ඉල්ලීම මත හපුතලේ ප්‍රාදේශීය සභාවේ බදු නිදහස් කිරීමේ නිර්වචිත ප්‍රතිපත්තිය සැලකිල්ලට ගෙන ආදායමෙන් කපා හැරීමටත් එකී ලැබිය යුතු ආදායම වැය විෂය අංක 309/01 යටතේ ගැළපීම සුදුසු බවත් යොජනා කරන්නී ය.

| | | | | | |
|---|---|---|---|---|---|
| අනු අංකය | 2021 අගෝස්තු/සැප්තැම්බර් මාස වල සංචරණ සීමා පැවති කාලය සඳහා කඩකුලී කපා හැරීම සභාවට යොමු කිරීම | | | | |
| | නම | කඩ අංකය | මාසික කුලිය | අත්හරින කාල සීමාව | |
| | දියතලාව නව වෙළඳ සංකීර්ණයේ දෙවන මහළ | | | අගෝ21-31 දක්වා | සැප්තැම්බර් මාසය |

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 | එච්.එම්.සී.එස්.සුගතදාස මයා,හෙළකඳුරුගමුව,දියතලාව | 21 | 3000 | 1000 | 3000 |
| 2 | අයි.ඩී.තමින්ද මංජුල මයා,නාවුල්ල,දෙමෝදර | 22 | 3000 | 1000 | 3000 |
| එකතුව | | | 6000 | 2000 | 6000 |
| ඉඩම් බදු කුලී | | | | | |
| 1 | සී/ප්‍රගති කෘෂි අලෙවි නිෂ්පාදන සංගමය | | 21000 | 7000 | 21000 |

<u>ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීආර්.එම්. සීගිරි ලංකා ඒකනායක  මහතා</u>

<u>විවාද</u>

2021-11-02 වන දින පැවති මුදල් කමිටු නිර්දේශය මත කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් රජය විසින් ක්‍රියාත්මක කරන ලද සංචරණ සීමා හේතුවෙන් 2021 අගෝස්තු මස 21 වන දින සිට 31 වන දින දක්වා සහ සැප්තැම්බර් මස රට වසා තබන දිනයන් සඳහා අය කළ යුතු පහත උප ලේඛනයේ සඳහන් වූ කඩකුලී රු.8,000.00 ක මුදල සහ බිම් කුලී රු.28,000.00ක මුදල එකී පුද්ගලයන්ගේ ඉල්ලීම මත හපුතලේ ප්‍රාදේශීය සභාවේ බදු නිදහස් කිරීමේ නිර්වචිත ප්‍රතිපත්තිය සැලකිල්ලට ගෙන ආදායමෙන් කපා හැරීමටත් එකී ලැබිය යුතු ආදායම වැය විෂය අංක 309/01 යටතේ ගැළපීම සුදුසු බවත් ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

| අනු අංකය | 2021 අගෝස්තු/සැප්තැම්බර් මාස වල සංචරණ සීමා පැවති කාලය සඳහා කඩකුලී කපා හැරීම සභාවට යොමු කිරීම | | | | |
|---|---|---|---|---|---|
| | නම | කඩ අංකය | මාසික කුලිය | අත්හරින කාල සීමාව | |
| | දියතලාව නව වෙළඳ සංකීර්ණයේ දෙවන මහළ | | | අගෝ21-31 දක්වා | සැප්තැම්බර් මාසය |
| 1 | එච්.එම්.සී.එස්.සුගතදාස මයා,හෙළකඳුරුගමුව,දියතලාව | 21 | 3000 | 1000 | 3000 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2 | අයි.ඩී.තමින්ද මංජුල මයා,නාවුල්ල,දෙමෝදර | 22 | 3000 | 1000 | 3000 |
| එකතුව | | | 6000 | 2000 | 6000 |
| ඉඩම් බදු කුලී | | | | | |
| 1 | සී/ප්‍රගති කෘෂි අලෙවි නිෂ්පාදන සංගමය | | 21000 | 7000 | 21000 |

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 05**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

හපුතලේ ප්‍රාදේශීය සභාවට අයත් වරිපනම් හිමියන් වෙත 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 155 වන වගන්තිය ප්‍රකාරව හිඟ වරිපනම් මුදල් ගෙවන ලෙස වරිපනම් ගෙවිය යුතු කාර්තුව අවසාන වී දින 14ක් ඇතුළත දැනුම් දීමේ ලිපි නිකුත් කිරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. චන්දන කිත්සිරි පෙරේරා මහතා

විවාද

හපුතලේ ප්‍රාදේශීය සභාවට අයත් වරිපනම් හිමියන් වෙත 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 155 වන වගන්තිය ප්‍රකාරව හිඟ වරිපනම් මුදල් ගෙවන ලෙස වරිපනම් ගෙවිය යුතු කාර්තුව අවසාන වී දින 14ක් ඇතුළත දැනුම් දීමේ ලිපි නිකුත් කිරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.සුදත් අරුණ රංජන මහතා අදහස් දක්වමින් ලිපි ලේඛන විශාල ප්‍රමාණයක් සැකසිය යුතු බැවින් ඒ සඳහා ක්‍රමවේදයක් සැකසීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 06**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

හපුතලේ ප්‍රාදේශීය සභාවට අයත් ZA – 5000 බැකෝ යන්ත්‍රය යොදවමින් මෙම සභා වාරය තුළ සිදු කරන ලද පොදු ප්‍රජා අවශ්‍යතා ඉටු කිරීමේ සහ ආපදා අවස්ථාවලදී සිදු කරන ලද කාර්යයන් වෙනුවෙන් යෙදවීම් වලට අදාලව වැය කරන ලද වැය වීම් සහා අරමුදලෙන් දැරීම සුදුසු බවත්

ඉදිරියේ දී ඉටු කරනු ලබන එවන් කාර්යයන් සඳහා මෙම යන්ත්‍රය යොදා ගැනීම වෙනුවෙන් වැය කරන ලද සියලු ගෙවීම් සභා අරමුදලෙන් දැරීම සඳහා එක් එක් සභාවට ඇස්තමේන්තුව යොමු කර අනුමත කර ගැනීම පවත්නා තත්ත්වය යටතේ ගැටලුකාරී බැවින් සමස්ත වියදම සභා අරමුදලෙන් දැරීම සුදුසු බව යෝජනා කරන්නී ය

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. චන්දන කිත්සිරි පෙරේරා මහතා

විවාද

හපුතලේ ප්‍රාදේශීය සභාවට අයත් ZA – 5000 බැකෝ යන්ත්‍රය යොදවමින් මෙම සභා වාරය තුළ සිදු කරන ලද පොදු ප්‍රජා අවශ්‍යතා ඉටු කිරීමේ සහ ආපදා අවස්ථාවලදී සිදු කරන ලද කාර්යයන් වෙනුවෙන් යෙදවීම් වලට අදාලව වැය කරන ලද වැය වීම් සභා අරමුදලෙන් දැරීම සුදුසු බවත් ඉදිරියේ දී ඉටු කරනු ලබන එවන් කාර්යයන් සඳහා මෙම යන්ත්‍රය යොදා ගැනීම වෙනුවෙන් වැය කරන ලද සියලු ගෙවීම් සභා අරමුදලෙන් දැරීම සඳහා එක් එක් සභාවට ඇස්තමේන්තුව යොමු කර අනුමත කර ගැනීම පවත්නා තත්ත්වය යටතේ ගැටලුකාරී බැවින් සමස්ත වියදම සභා අරමුදලෙන් දැරීම සුදුසු බවත් ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකගතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකගතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 07**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 132 එ වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ නිලධරයන්ගේ හා සේවකයින්ගේ සුභ සාධනය සඳහා ප්‍රාදේශීය සභාවේ නිලධරයන් හා සේවකයින් දිගු කාලීන බලපෑමක් සහිත රෝගයකට ගොදුරු වූ වීම, ආපදා අවස්ථා සඳහා මුහුණ දීම, ණයගැති වූ විට සහන සැලසීම සඳහා යම් කිසි අරමුදලක් හෝ යෝජනාවකට නියම කරනු ලබන සීමා කිරීම්වලට යටත්ව අවස්ථානුකූලව සභාව විසින් ආධාර මුදලක් ලබා දීම සුදුසු බවට ප්‍රතිපත්තියක් අනුමත කිරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

ඒ යටතේ මෙම ආයතනයේ සේවය කරන කළමනාකරණ සේවා නිලධාරිනියක වන ආර්.එම්. නිල්මිණී රත්නායක මහත්මිය පිළිකා රෝගයෙන් පෙළෙන බැවින් ඒ සඳහා ආධාර මුදලක් ලෙස රු. 100,000.00ක ආධාර මුදලක් ලබා දීම සුදුසු බව යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා උප සභාපති වයි.එම්. නිමල් අමරසිරි මහතා

විවාද

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 132 එ වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ නිලධරයන්ගේ හා සේවකයින්ගේ සුභ සාධනය සඳහා ප්‍රාදේශීය සභාවේ නිලධරයන් හා සේවකයින් දිගු කාලීන බලපෑමක් සහිත රෝගයකට ගොදුරු වූ වීම, ආපදා අවස්ථා සඳහා මුහුණ දීම, ණයගැති වූ විට සහන සැලසීම සඳහා යම් කිසි අරමුදලක් හෝ යෝජනාවකට නියම කරනු

ලබන සීමා කිරීම්වලට යටත්ව අවස්ථානුකූලව සභාව විසින් ආධාර මුදලක් ලබා දීම සුදුසු බවට ප්‍රතිපත්තියක් අනුමත කිරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ යටතේ මෙම ආයතනයේ සේවය කරන කළමනාකරණ සේවා නිලධාරිනියක වන ආර්.එම්. නිල්මිණී රත්නායක මහත්මිය පිළිකා රෝගයෙන් පෙළෙන බැවින් ඒ සඳහා ආධාර මුදලක් ලෙස රු. 100,000.00ක ආධාර මුදලක් ලබා දීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.සුදත් අරුණ රංජන මහතා අදහස් දක්වමින් වෛද්‍යාධාර ලබා දීම් සිදු කිරීමේ දී එකී කටයුතු කඩිනමින් සිදු කළ යුතු බවත් නොඑසේ නම් එසේ ලබා දෙනු ලබන ප්‍රතිලාභ තුළින් ඇතැම් අවස්ථාවලදී ප්‍රයෝජනයක් සිදු නොවන බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්. සුදර්ශන මහතා අදහස් දක්වමින් මෙකී යෝජනාවේ සඳහන් ණයගැතිභාවයට පත් වීමේ දී සහන ලබා දෙනුයේ කෙසේ ද යන්නෙහි අරුත පැහැදිලි කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 132 එ වගන්තිය ප්‍රකාරව එසේ සඳහන් කළ යුතු බවත් දිගු කාලීන බලපෑමක් සහිත රෝගයකට ගොදුරු වූ වීම, ආපදා අවස්ථා සඳහා මුහුණ දීම, ණයගැති වූ විට සහන සැලසීම සඳහා යම් කිසි අරමුදලක් හෝ යෝජනාවකට නියම කරනු ලබන සීමා කිරීම්වලට යටත්ව අවස්ථානුකූලව සභාව විසින් තීරණය කර ආධාර මුදලක් ලබා දීම සිදු කරන බව පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 08**

<u>ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා</u>

ඌව පළාත් පාලන කොමසාරිස්තුමන්ගේ 2022.02.23 දිනැති 12/05/02 අංක දරන ලිපිය ප්‍රකාරව ඌව පළාතේ ප්‍රජා මණ්ඩල සවිබල ගැන්වීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම යටතේ හපුතලේ ප්‍රාදේශීය සභාවට අදාලව අත්‍යාවශ්‍ය ග්‍රාම නිලධාරී වසම් සඳහා ප්‍රජා මණ්ඩල පිහිටුවීම සුදුසු බව යෝජනා කරන්නී ය.

<u>ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්. සුදර්ශන මහතා</u>

<u>විවාදය</u>

ඌව පළාත් පාලන කොමසාරිස්තුමන්ගේ 2022.02.23 දිනැති 12/05/02 අංක දරන ලිපිය ප්‍රකාරව ඌව පළාතේ ප්‍රජා මණ්ඩල සවිබල ගැන්වීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම යටතේ හපුතලේ ප්‍රාදේශීය සභාවට අදාලව අත්‍යාවශ්‍ය ග්‍රාම නිලධාරී වසම් සඳහා ප්‍රජා මණ්ඩල පිහිටුවීම සුදුසු බවත් ඒ සම්බන්ධයෙන් සම්බන්ධීකරණ නිලධාරියෙකු පත් කර ඇති බැවින් එකී නිලධාරී මහතාගේ උපදේශනය මත ප්‍රජා මණ්ඩල පිහිටුවීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. සුදත් අරුණ රංජන මහතා අදහස් දක්වමින් ග්‍රාම සංවර්ධන සංවිධාන කමිටුව ඒ සඳහා යොදා ගැනීම සුදුසු බව පැහැදිලි කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්. විමලසිරි මහතා අදහස් දක්වමින් ග්‍රාම නිලධාරී වසම් සඳහා ප්‍රජා මණ්ඩල පිහිටුවීම සම්බන්ධයෙන් පුහුණු අවස්ථාවක් සඳහා තමා සහභාගි වූ බවත් එය වැදගත් කටයුත්තක් බවත් තම වසමට ප්‍රජා මණ්ඩලයක් පිහිටු වීම අවශ්‍ය බවත් වසමකට එක් ප්‍රජා මණ්ඩලය බැගින් පිහිටුවීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් අදහස් දක්වමින් සම්බන්ධීකරණ නිලධාරී මහතාගේ උපදේශනය මත ප්‍රජා මණ්ඩල පිහිටුවීමට කටයුතු සිදු කිරීම සුදුසු බව පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 09**

<u>ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා</u>

හපුතලේ ප්‍රාදේශීය සභාව විසින් සකසන පළාත් පාලන ආයතන සහභාගීත්ව සංවර්ධන සැලැස්ම හෝ මධ්‍ය කාලීන සංවර්ධන සැලැස්ම සැකසීම සඳහා විවිධත්වයෙන් යුතු ප්‍රජා කණ්ඩායම් හඳුනා ගැනීම යටතේ බල ප්‍රදේශයේ සිටින ආබාධිත පුද්ගලයින්, කාන්තා මූලික පවුල්, රැකියා විරහිත තරුණයන් , වැඩිහිටි ප්‍රජාව , හඳුනාගත් සහ ප්‍රමුඛතාගත කරන ලද වරප්‍රසාද රහිත කණ්ඩායම් වල සාමාජිකයන් ඇතුළත් කර උපදේශන කමිටුවක් සකස් කිරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

<u>ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීර්.එම්. සීගිරි ලංකා ඒකනායක මහතා</u>

<u>විවාද</u>

හපුතලේ ප්‍රාදේශීය සභාව විසින් සකසන පළාත් පාලන ආයතන සහභාගීත්ව සංවර්ධන සැලැස්ම හෝ මධ්‍ය කාලීන සංවර්ධන සැලැස්ම සැකසීම සඳහා විවිධත්වයෙන් යුතු ප්‍රජා කණ්ඩායම් හඳුනා ගැනීම යටතේ බල ප්‍රදේශයේ සිටින ආබාධිත පුද්ගලයින්, කාන්තා මූලික පවුල්, රැකියා විරහිත තරුණයන් , වැඩිහිටි ප්‍රජාව , හඳුනාගත් සහ ප්‍රමුඛතාගත කරන ලද වරප්‍රසාද රහිත කණ්ඩායම් වල සාමාජිකයන් ඇතුළත් කර උපදේශන කමිටුවක් සකස් කිරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ගරු උප සභාපති වයි.එම්.නිමල් අමරසිරි මහතා විසින් උක්ත කමිටුව සඳහා ගරු මන්ත්‍රී මණ්ඩලයම යොදා ගැනීම සුදුසු බවත් ඔවුන් හරහා අදාළ ග්‍රාම නිලධාරී වසම්වල සිටින විවිධත්වයෙන් යුතු ප්‍රජා කණ්ඩායම්වල අවශ්‍යතා හඳුනාගෙන උපදේශන සැපයීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය මෙම කමිටුව සඳහා යොදා ගැනීම සුදුසු බවට අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 10**

<u>ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා</u>

හපුතලේ ප්‍රාදේශීය සභාව විසින් පළාත් පාලන ආයතන සඳහා වසංගතයන්ට මුහුණ දීම සඳහා සකසන ලද සැලැස්ම හා ප්‍රතිපත්තිය සභා සම්මත කිරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. ඉන්ද්‍රතිලක රාමනායක මහතා

විවාද

හපුතලේ ප්‍රාදේශීය සභාව විසින් පළාත් පාලන ආයතන සඳහා වසංගතයන්ට මුහුණ දීම සඳහා සකසන ලද සැලැස්ම හා ප්‍රතිපත්තිය සභා සම්මත කිරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 11**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

හපුතලේ ප්‍රාදේශීය සභාව සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ සමාජීය සියලු ජන කොටස්වල ඇතුලත් භාවය පිළිබඳව සකසන ලද අභ්‍යන්තර ප්‍රතිපත්තිය සභා සම්මත කිරීම සුදුසු බවත් සැලසුම්කරණය සහ අයවැයකරණ ක්‍රියවලියේ දී සියලු ජන කොටස්වල ඇතුලත් භාවය සහතික කිරීමට අවශ්‍යතා සඳහා 2023 අයවැය සඳහා මුදල් වෙන් කිරීම සුදුසු බවත් යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. චන්දන කිත්සිරි පෙරේරා මහතා

විවාද

හපුතලේ ප්‍රාදේශීය සභාව සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ සමාජීය සියලු ජන කොටස්වල ඇතුලත් භාවය පිළිබඳව සකසන ලද අභ්‍යන්තර ප්‍රතිපත්තිය සභා සම්මත කිරීම සුදුසු බවත් සැලසුම්කරණය සහ අයවැයකරණ ක්‍රියවලියේ දී සියලු ජන කොටස්වල ඇතුලත් භාවය සහතික කිරීමට අවශ්‍යතා සඳහා 2023 අයවැය සඳහා මුදල් වෙන් කිරීම සුදුසු බවත් ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 12**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

හපුතලේ ප්‍රාදේශීය සභාවට අයත් වාහන සංඛ්‍යාවට සරිලන රියදුරන් සංඛ්‍යාවක් නොමැති වීම මත ගැටලුකාරී තත්ත්වයකට මුහුණ දී ඇති බැවින් ඒ සඳහා දැනට සේවයෙ නියුතු සුදුසු ක්ෂේත්‍ර කම්කරුවෙකු වෙත ඔහුගේ සුදුසුකම් පිළිබඳ සලකා බලා රියදුරු තනතුරෙහි සේවය කිරීමට අවශ්‍ය අනුමැතිය අමාත්‍යංශ ලේකම්තුමියගෙන් ලබා ගැනීමටත් ඒ අනුව මෙම ආයතනය සඳහා

අවශ්‍ය ක්ෂේත්‍ර කම්කරුවෙකු සහා අරමුදලෙන් වියදම් දරා සේවයට යොදවා ගැනීම පළාත් පාලන කොමසාරිස්තුමන්ගේ අනුමැතිය මත සිදු කිරීම සුදුසු බවත් යෝජනා කරන්නී ය.

<u>ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. චන්දන කිත්සිරි පෙරේරා  මහතා</u>

<u>විවාද</u>

හපුතලේ ප්‍රාදේශීය සභාවට අයත් වාහන සංඛ්‍යාවට සරිලන රියදුරන් සංඛ්‍යාවක් නොමැති වීම මත ගැටලුකාරී තත්ත්වයකට මුහුණ දී ඇති බැවින් ඒ සඳහා දැනට සේවයෙ නියුතු සුදුසු ක්ෂේත්‍ර කම්කරුවෙකු වෙත ඔහුගේ සුදුසුකම් පිළිබඳ සලකා බලා රියදුරු තනතුරෙහි සේවය කිරීමට අවශ්‍ය අනුමැතිය අමාත්‍යංශ ලේකම්තුමියගෙන් ලබා ගැනීමටත් ඒ අනුව මෙම ආයතනය සඳහා අවශ්‍ය සෞඛ්‍ය කම්කරුවෙකු සහා අරමුදලෙන් වියදම් දරා සේවයට යොදවා ගැනීම පළාත් පාලන කොමසාරිස්තුමන්ගේ අනුමැතිය මත සිදු කිරීම සුදුසු බවත් ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## යෝජනා අංක 13

<u>ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා</u>

2022 වර්ෂයේ සිංහල හින්දු අළුත් අවුරුද්ද නිමිත්තෙන් හපුතලේ ප්‍රාදේශීය සභාවේ කාර්ය මණ්ඩළයේ හා ගරු මන්ත්‍රීමණ්ඩළයේ සහභාගීත්වයෙන් දියතලාව නගරයේ ප්‍රජාව උදෙසා සංස්කෘතික උත්සවයක් ලෙස පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇති සිංහල හිංදු අලුත් අවුරුදු උත්සවය වෙනුවෙන් රුපියල් 100,000.00 ක මුදලක් සභා අරමුදලෙන් දැරීම සුදුසු බව යෝජනා කරන්නීය.

<u>ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්. සුදර්ශන මහතා</u>

<u>විවාද</u>

2022 වර්ෂයේ සිංහල හිංදු අළුත් අවුරුද්ද නිමිත්තෙන් හපුතලේ ප්‍රාදේශීය සභාවේ කාර්ය මණ්ඩළයේ හා ගරු මන්ත්‍රීමණ්ඩළයේ සහභාගීත්වයෙන් දියතලාව නගරයේ ප්‍රජාව උදෙසා සංස්කෘතික උත්සවයක් ලෙස පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇති සිංහල හිංදු අලුත් අවුරුදු උත්සවය වෙනුවෙන් රුපියල් 100,000.00 ක මුදලක් සභා අරමුදලෙන් දැරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්. සුදර්ශන මහතා අදහස් දක්වමින් වර්තමානය වන විට උද්ගත වී ඇති ආර්ථික අර්බුදය හමුවේ සිදු කළ යුතු වන්නේ අවුරුදු උත්සව පැවැත්වීම නොව ප්‍රජාවට සහන සැලසීම බවත් සභාව මූලික වී ආහාර සලාක හෝ ලබා දීමට කටයුතු සිදු කරන්නේ නම් අවස්ථානුකූලව එය මහගු කාර්යයක් බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති වයි.එම්. නිමල් අමරසිරි මහතා අදහස් දක්වමින් අවුරුදු උත්සවය සඳහා වෙන් කරනු ලබන ප්‍රතිපාදන මුදලින් ප්‍රජාව උදෙසා වියළි ආහාර සලාක, රෝද පුටු, කිහිළි කරු වැනි දේ සභාව වෙත එකී ප්‍රතිලාභ ලබන්නා වූ පුද්ගලයන් රැගෙන විත් ලබා දීමට කටයුතු සිදු කරන්නේ නම් එය යහපත් ක්‍රියාවක් බවත් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර,වෙන් කරන ලද ප්‍රතිපාදන මගින් ප්‍රජාව උදෙසා සුභසාධක කටයුත්තක් සිදු කිරීම සුදුසු බවට තීරණය වූ බැවින් ගරු මන්ත්‍රී මණ්ඩලය බොහෝ දෙනෙකුගේ විරුද්ධත්වය මත එකී යෝජනාව ප්‍රතික්ෂේප වී සභා සම්මත නොවී ය.

**යෝජනා අංක 14**

<u>ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා</u>

හපුතලේ සමෘද්ධි බැංකුව විසින් යොමු කරන ලද BD/HP/SMD/MAHA/4/19/1 අංක දරණ ලිපිය ප්‍රකාරව සමෘද්ධි නිවාස වැඩසටහන -2021 යටතේ තොටලාගල වසමේ පදිංචි පී. පුවනේන්ද්‍රන් මහතාහට 2021 වසරේ සමෘද්ධි දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ නිවාසයක් ඉදි කිරීම ආරම්භ කර ඇති අතර එකී නිවසේ ඉතිරි වී ඇති වැඩ කටයුතු නිමවා ගැනීම සඳහා අවශ්‍ය ද්‍රව්‍යාධාර ලෙස අඩි 12 ඇස්බැස්ටෝස් සීට් 01 හා අඩි 10 ඇස්බැස්ටෝස් සීට් 06ක් කාර්මික නිලධාරි ඇස්තමේන්තු ගත රු. 23,308.78 මුදලකට ගරු ආණ්ඩුකාරතුමන්ගේ පූර්ව අනුමැතිය මත සභා අරමුදලෙන් දැරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

<u>ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. චන්දන කිත්සිරි පෙරේරා මහතා</u>

<u>විවාද</u>

හපුතලේ සමෘද්ධි බැංකුව විසින් යොමු කරන ලද BD/HP/SMD/MAHA/4/19/1 අංක දරණ ලිපිය ප්‍රකාරව සමෘද්ධි නිවාස වැඩසටහන -2021 යටතේ තොටලාගල වසමේ පදිංචි පී. පුවනේන්ද්‍රන් මහතාහට 2021 වසරේ සමෘද්ධි දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ නිවාසයක් ඉදි කිරීම ආරම්භ කර ඇති අතර එකී නිවසේ ඉතිරි වී ඇති වැඩ කටයුතු නිමවා ගැනීම සඳහා අවශ්‍ය ද්‍රව්‍යාධාර ලෙස අඩි 12 ඇස්බැස්ටෝස් සීට් 01 හා අඩි 10 ඇස්බැස්ටෝස් සීට් 06ක් කාර්මික නිලධාරි ඇස්තමේන්තු ගත රු. 23,308.78 මුදලකට ගරු ආණ්ඩුකාරතුමන්ගේ පූර්ව අනුමැතිය මත සභා අරමුදලෙන් දැරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. සුදත් අරුණ රංජන මහතා අදහස් දක්වමින් මෙම යෝජනාව යොමු කර ඇති පුද්ගලයා අයත් වසමට අදාල ගරු මහජන නියෝජිතයා හෝ නියෝජිතයින් සඳහා වාර්ෂිකව ප්‍රතිපාදන මුදල් වෙන් කරනු ලබන්නේ මෙවැනි කටයුතු සම්බන්ධයෙන් බවත් එබැවින් එකී මහජන නියෝජිත ප්‍රතිපාදන යටතේ මේ කටයුතු සිදු කළ යුතු බවත් සෑම වසමකින්ම මෙවැනි කටයුතු සම්බන්ධයෙන් ඉල්ලීම් සිදු කළහොත් සභා අරමුදලෙන් එවැනි කටයුතු සිදු කරන්නේ කෙසේද යන්න ප්‍රකාශ කළ අතර ගරු ප්‍රාදේශීය සභා උප සභාපති වයි. එම් .නිමල් අමරසිරි මහතා මෙ න්ම ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්. විමලසිරි මහතා ද මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් මෙම ගැටලුව සෑම වසමකටම පොදු ගැටලුවක් බවත් වසම නියෝජනය කරනු ලබන සභිකයා වෙත වෙන් වී ඇති ප්‍රතිපාදන මගින් එකී කටයුතු සිදු කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී. මහේන්ද්‍රන් මහතා අදහස් දක්වමින් පී. පුවනේන්ද්‍රන් මහතා දැඩි ආර්ථික අපහසුතා මධ්‍යයේ ජීවත් වන අඩු ආදායම්ලාභී පුද්ගලයකු වන බැවින් මෙම ද්‍රව්‍යාධාර ලබා දීමට කටයුතු සිදු කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමන් මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් වසම නියෝජනය කරනු ලබන ගරු මහජන නියෝජිතයා හෝ නියෝජිතයින් සඳහා වාර්ෂිකව වෙන් කරනු ලබන ප්‍රතිපාදන යටතේ මෙකී ද්‍රව්‍යාධාර ලබා දීමට කටයුතු සිදු කරන බව ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, වසම නියෝජනය කරනු ලබන ගරු මහජන නියෝජිතයා හෝ නියෝජිතයින් සඳහා වාර්ෂිකව වෙන් කරනු ලබන ප්‍රතිපාදන යටතේ මෙකී ද්‍රව්‍යාධාර ලබා දීම සුදුසු බවට ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 15**

ඉදිරිපත් කිරීම - ගරු සභාපති බී. කන්දසාමි මහතා

2022 .03 .03 වන දින පවත්වන ලද නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාවේ සඳහන් දියතලාව , හපුතලේගම, ගල්ලියද්ද වත්ත හි පදිංචි බී.එම්. හීන්මැණිකා මහත්මියගේ පර්චස් 6.1 වන ඉඩම සඳහා එකඟතාවය ලබා දුන් කමිටු නිර්දේශය සභාවට ඉදිරිපත් කිරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. චන්දන කිත්සිරි පෙරේරා මහතා

විවාදය

2022 .03 .03 වන දින පවත්වන ලද නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාවේ සඳහන් දියතලාව , හපුතලේගම, ගල්ලියද්ද වත්ත හි පදිංචි බී.එම්. හීන්මැණිකා මහත්මියගේ පර්චස් 6.1 වන ඉඩම සඳහා එකඟතාවය ලබා දුන් කමිටු නිර්දේශය සභාවට ඉදිරිපත් කිරීම සුදුසු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා

**යෝජනා අංක 01**

ඉදිරිපත් කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගෝපාලන් මුරුගන් මහතා

2022 අයවැය යෝජනා යටතේ තම කොට්ඨාසයේ සංවර්ධනය සඳහා වෙන් වී ඇති ප්‍රතිපාදන මත පාසල් ළමුන් සඳහා පාසල් උපකරණ ලබා දීම සුදුසු බව යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. චන්දන කිත්සිරි පෙරේරා මහතා

විවාද

2022 අයවැය යෝජනා යටතේ තම කොට්ඨාසයේ සංවර්ධනය සඳහා වෙන් වී ඇති ප්‍රතිපාදන මත පාසල් ළමුන් සඳහා පාසල් උපකරණ ලබා දීම සුදුසු බවත් ඒ අනුව ඒ සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ පූර්ව අනුමැතිය ලබා ගෙන අදාල වියදම් දැරීම සුදුසු බවත් ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 02**

ඉදිරිපත් කිරීම- ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී. මහේන්ද්‍රන් මහතා

2019 වසරේ නාය යෑමේ අවධානමට ලක් වූ පවුල් 66ක් සඳහා නව නිවාස ඉදි කර දීම වෙනුවෙන් ක්‍රියාත්මක වූ හපුතලේ දඹේතැන්න වත්ත , මාවුස්සාගොල්ල කොටස නිවාස ව්‍යාපෘතියේ වැඩ මේ වන තෙක් අවසන් නොවීම හේතුවෙන් එකී වැඩ නිමවා ජනතාවට පදිංචි වීමට අවශ්‍ය කටයුතු ඉටු කළ යුතු බව යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ආර්.එම්. අනුලාවතී මල්ලිකා මහත්මිය

විවාද

2019 වසරේ නාය යෑමේ අවධානමට ලක් වූ පවුල් 66ක් සඳහා නව නිවාස ඉදි කර දීම වෙනුවෙන් ක්‍රියාත්මක වූ හපුතලේ දඹේතැන්න වත්ත , මාවුස්සාගොල්ල කොටස නිවාස ව්‍යාපෘතියේ වැඩ මේ වන තෙක් අවසන් නොවීම හේතුවෙන් එකී වැඩ නිමවා ජනතාවට පදිංචි වීමට අවශ්‍ය කටයුතු ඉටු කළ යුතු බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී මහේන්ද්‍රන් මහතා අදහස් දක්වමින් හපුතලේ දඹේතැන්න වත්ත මාවුස්සාගොල්ල කොටස නිවාස ව්‍යාපෘතිය 2020.07.04 වන දින මුල්ගල් තබා ආරම්භ කළ බවත් පවුල් 66ක් පදිංචි කිරීමට තිබිය දී පවුල් 65 ක් පදිංචි කිරීම සඳහා කටයුතු සිදු කළ බවත් නමුත් මේ වන තුරුත් මෙකී ව්‍යාපෘතියේ වැඩ කටයුතු අවසන් කිරීමට නොහැකි වී ඇති බවත් අත්තිවාරම් මට්ටමට ගෙවල් 34 ක් හා ලින්ටන් මට්ටමට ගෙවල් 31 ක් මේ වන විට ඉදි කිරීම් කටයුතු සිදු කර ඇති බවත්ය. මෙකී ව්‍යාපාතිය හිමි වුයේ මීරියබැද්ද නායයාමෙන් විශාල ජීවිත ප්‍රමාණයක් අහිමි වීම හේතුවෙන් ජනතාව පත්ව සිටි අසීරුතාවය පිළිබඳ සැලකිලිමත්ව වෙනත් රටවලින් ලද ආධාරයක් ලෙස බවත් මීරියබැද්ද නාය යෑමට ලක් වූ ස්ථානයත් මාවුස්සාගොල්ල ප්‍රදේශයත් අතර කි.මී. 2 ක ප්‍රදේශයක මෙකී නිවාස ව්‍යාපෘතිය ආරම්භ කර පදිංචි කිරීමට කටයුතු සිදු කළ බවත් ප්‍රකාශ කරන ලදී.එසේම ප්‍රාදේශීය සභාව මැදිහත් වීමෙන් බැකෝ යන්ත්‍රය යොදවා එකී අවතැන් වූ පුද්ගලයන් හට තාවකාලික කඳවුරක් සාදා දුන් බවත් එකී තාවකාලික කඳවුරෙහි නිවාස ඉදි කිරීම ආරම්භ කළ බවත් අත්තිවාරම් මට්ටමට හා ලින්ටන් මට්ටමට නිවාස ඉදි කිරීම් කටයුතු සිදු කළ

බැවින් ප්‍රජාව එකී නිවාස නුදුරේදීම තමාට ලැබෙනු ඇතැයි යන අපේක්ෂාවෙන් මේ වන විට ජීවත් වන නිවෙස් කිසිදු අලුත්වැඩියාවක් නොකර සිටින නමුත් ආරම්භ කළ නිවාස ව්‍යාපෘතිය මේ වන විට කැලෑ වැවී ඇති බවත් ප්‍රකාශ කළේ ය.එකී නිවාස ව්‍යාපෘතිය සම්බන්ධයෙන් මුල සිටම කටයුතු කළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය බවත් ගරු සභාපතිතුමන් මැදිහත්වී ප්‍රාදේශීය ලේකම්තුමන් සමඟ සාකච්ඡා කර මෙකී නිවාස ව්‍යාපෘතියෙහි කටයුතු ඉදිරියට පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ඉල්ලා සිටින බව ප්‍රකාශ කරන ලදී.එසේම බැකෝ යන්ත්‍රයක් යොදා ගෙන නැවත වරක් එකී නිවාසවලට ගමන් කරනු ලබන මාර්ගය සංවර්ධනය කිරීමට කටයුතු කරන බවත්, ආපදා කළමනාකරණ අමාත්‍යංශය මඟින් ප්‍රතිපාදන වෙන් නොකර එකී ප්‍රජාවගෙන් රු. 10,000.00 ක මුදලක් අය කර ගන්නා බවට තොරතුරු ලැබී ඇති බවත් කොන්ත්‍රාත් ගන්නා ලද පුද්ගලයින් මේ වන විට එකි ස්ථානය නැරඹීමට පවා නොපැමිණෙන බවත් ජලය මාර්ගය හරහා ගලා ගොස් අපතේ යන බවත් ප්‍රකාශ කළ අතර,ගරු සභාපතිතුමන් මැදිහත් වී මෙම වර්ෂයේ වර්ෂාව ආරම්භ වීමට පෙර එනම් නොවැම්බර් මාසයට පෙර මෙකී නිවාස ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීම සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කර දෙන ලෙස ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්.සීගිරි ලංකා ඒකනායක මහතා අදහස් දක්වමින් තමා විසින් එකී නිවාස ව්‍යාපෘතිය නැරඹීමට ලක්කළ බවත් එකී මාර්ගය ඉදි කරන ලද්දේ කොන්ත්‍රාත්කරු විසින් ද යන්න විමසන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී මහේන්ද්‍රන් මහතා අදහස් දක්වමින් ආපදා කළමණාකරණ ඒකකය යටතේ එකී නිවාස ව්‍යාපෘතිය ආරම්භ කර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරින් හා කාර්මික නිලධාරි හරහා මෙකී ව්‍යාපතිය ක්‍රියාත්මක වූ බවත්, කොන්ත්‍රාත්කරු විසින් මෙහි වැඩ අවසන් කිරීමට පෙර මඟ නතර කොට ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගෝපාලන් මුරුගන් මහතා අදහස් දක්වමින් මෙකී නිවාස ව්‍යාපෘතියෙන් එක් නිවසක් සඳහා ලක්ෂ 16ක මුදලක් වෙන් වී තිබූ බවත්, ලක්ෂ 16ක ප්‍රතිපාදන යටතේ මෙකී නිවාස ව්‍යාපෘති හිමිවන්නේ නම් එය නිවාස සංවර්ධන අධිකාරිය යටතේ ක්‍රියාත්මක කළ යුතු නිවාස ව්‍යාපෘතියක් වුවද මෙකී ව්‍යාපෘතිය ආපදා කළමණාකරණ අංශය යටතේ ආරම්භ කොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා ක්‍රියාත්මක වූ බැවින් මේ වන විට මුහුණ දී ඇති ගැටළුකාරි තත්වය හමුවේ තමා හට ගැටළු තුනක් පැන නැගී ඇති බවත් ඉන් පළමුවැන්න ලෙස මෙකී ව්‍යාපෘතියට අදාළ නිවාස ඉදිකිරීමේදී ඉඩම වෙන් කිරීම සඳහා ලක්ෂ 04ක මුදලක් වෙන් වී තිබූ බවත් ලක්ෂ 04 බැගින් නිවෙස් 66ක් සඳහා වන ප්‍රතිපාදන මුදල ඉඩම වෙන් කිරීමෙන් පසු වතු සමාගමට ගෙවා අවසන් කර තිබේද එසේ නොමැති නම් වෙනත් බාහිර පාර්ශවයක් විසින් පෞද්ගලිකව එකී මුදල් ලබාගෙන තිබේද, එකී මුදලට සිදු වූයේ කුමක්ද යන්න විගණන අංශයට යොමුකර ඒ සඳහා විසඳුමක් ලබාගත යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

දෙවන කාරණාව යටතේ මෙකී ව්‍යාපෘතිය ආරම්භ කරන විට ඉඩම සැකසීම සඳහා ලක්ෂ 12ක ප්‍රතිපාදන මුදලක් එක් නිවසක් සඳහා වෙන් කර තිබූ බවත් පර්චස් 3.5 ලෙස භූමිය සකස් කර පර්චස් 07ක් ලෙස පෙන්වා ඉඩම නිසි ප්‍රමිතියට පවා සකස් නොකර එකී මුදල් ද ගෙවා අවසන් බැවින් දෙවන අදියර යටතේ සම්පූර්ණෙන්ම කොපමණ මුදලක් ගෙවා අවසන් කර තිබේද යන්න විගණනයට ලක් විය යුතු බව ප්‍රකාශ කරන ලදී.

තෙවන කාරණාව යටතේ මෙකී ව්‍යාපෘතිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා සිදුකළ අතර, ගෙවීම් සිදුකිරීමේදී කාර්මික නිලධාරීතුමාගේ නිර්දේශය මත මේ වන විට ව්‍යාපෘතියට වෙන්වූ මුදලින් කොපමණ මුදලක් මේ වන විට ගෙවා අවසන් කර තිබේද යන්න විගණනයට ලක්විය යුතු බව ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.මහේන්ද්‍රන් මහතා අදහස් දක්වමින් ප්‍රාදේශීය ලේකම්තුමන් හා කාර්මික නිලධාරීතුමන්ගේ නිර්දේශය මත ව්‍යාපෘතියේ වැඩ අවසන් වූ පසු ගෙවීම් කටයුතු සිදුවන බව ප්‍රකාශ කළ අතර නිවාස සඳහා වෙන් වූ ලක්ෂ 16ක ප්‍රතිපාදන සියල්ලම මේ වන විට ගෙවී අවසන් කර තිබේද නොඑසේ නම් කිසියම් හෝ ප්‍රතිපාදන කොටසක් ඉතිරි වී තිබේද එසේ ඉතිරි වී ඇති ප්‍රතිපාදන මත නිවාස ව්‍යාපෘතියට අදාළ ඉදිරි කටයුතු පවත්වාගෙන යා හැකිද යන කරුණු පිළිබඳ අවධානය යොමුකර විගණන අංශ හෝ දැනුවත් කර මේ සම්බන්ධයෙන් විමර්ශණයක් සිදු කළ යුතු බව ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් හපුතලේ ප්‍රාදේශීය සභාවට අයත් බැකෝ යන්ත්‍රය යොදා ගෙන ඉඩම සකස් කළ බවත් කොන්ත්‍රාත්කරුට අවශ්‍ය ආකාරයට භූමිය සකස් කිරීම සඳහා සභාවට අයත් බැකෝ යන්ත්‍රය ලබා දුන් බවත් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.සුදත් අරුණරංජණ මහතා අදහස් දක්වමින් නිවාස ව්‍යාපෘතිය භාර කොන්ත්‍රාත්කරු විසින් සභාවට අයත් බැකෝ යන්ත්‍රය යොදාගෙන එහි භූමිය සකස් කිරීමට අදාළව සභාවට මුදල් ගෙවීම සිදුකළ යුතු ව තිබූ බව අවධාරණය කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.සගාදේවන් මහතා අදහස් දක්වමින් නිවාස ව්‍යාපෘතිය ආරම්භ කළ අවස්ථාවේදී ආපදා කළමණාකරණ අමාත්‍යාංශය යටතේ නිවාස කමිටුවක් පත්කර ගෙන තිබේද යන්නත් මෙවැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ඊට අදාළව නිවාස කමිටුවක් පිහිටුවා ඒ හරහා ගෙවීම් සිදුකළ යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගෝපාලන් මුරුගන් මහතා අදහස් දක්වමින් නිවාස සංවර්ධන අධිකාරිය විසින් සිදුකළ යුතුව තිබූ මෙකී නිවාස ව්‍යාපෘතිය ආපදා කළමණාකරණ අමාත්‍යාංශය යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා සිදුකිරීමට භාර දුන් බවත් එහි නිලධාරීන් මෙකී ව්‍යාපෘතිය භාරව කටයුතු කළ බවත් මේ සම්බන්ධයෙන් විගණනයක් ලබාදෙන දෙන ලෙසත් නැවතත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.සුදත් අරුණරංජණ මහතා අදහස් දක්වමින් මෙකී ව්‍යාපෘතිය භාරව මුල සිට ක්‍රියාත්මක වුයේ ප්‍රාදේශීය ලේකම් කර්යාලය බවත් ගරු සභාපතිතුමන් මැදිහත් වී මේ සම්බන්ධයෙන් සොයා බලා ඊළඟ සභාවාරයේ දී හෝ කරුණු පැහැදිලි කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.මහේන්ද්‍රන් මහතා අදහස් දක්වමින් ප්‍රාදේශීය සභා පනතට අනුව නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුවට මෙකී ගැටළුව යොමුකළ හැකි ද යන්න කාරක සභා අවස්ථාවක් ලබාගත හැකි ද යන්න විමසන ලදී.

ගරු සභාපතිතුමන් මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් මෙය ප්‍රාදේශීය සභා පනතට අනුව නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුවට යොමු කළ නොහැකි බවත් ප්‍රකාශ කළ අතර එම අවස්ථාවේ දී ම

දුරකථන ඇමතුමක් ලබාගනිමින් ප්‍රාදේශීය ලේකම්තුමන් සමඟ මේ සම්බන්ධයෙන් සාකච්ඡා කර එහිදී ලද පිළිතුර මත වැඩ කටයුතු නතර වී ඇති ව්‍යාපෘතිය නැවත ඇස්තමේන්තු ගත කර අමාත්‍යාංශය වෙත යොමුකළ බවත් ඉදිරියේදී ඒ සම්බන්ධයෙන් කටයුතු සිදු කරන බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී වී.එලිල් අරසි මහත්මිය අදහස් දක්වමින් පිටරත්මලේ වතුයායේ පිහිටි ලයම් කාමර 30 හා 31හි පදිංචි ප්‍රජාව සඳහා නිවාස ඉදි කර දෙන බවට පසුගිය දිනෙක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් විසින් දැනුවත් කර තිබූ බවත්, ලයම් කාමර 30 හා 31හි පදිංචි ප්‍රජාව අධික වර්ෂාව ඇති අවස්ථාවලදී තාවකාලික පාසල් කඳවුරේ නවාතැන් ගන්නා බවත්, තාවකාලික කඳවුරෙහි පහසුකම් ලබාදෙන බවට ග්‍රාම නිලධාරී හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් දැනුම් දී ඇති බවත් පසුගිය මස තුන්වන දින නව නිවාස ව්‍යාපෘතියක් හිමි වී ඇති බවට රැස්වීමක් තබා ප්‍රජාව දැනුවත් කර ඇති බවත් ඊට අදාළව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නම් ලැයිස්තුවක් ලබාගෙන ඇති නමුත් වතු සුභසාධක නිලධාරිනිය මීට අදාල ගොඩනැගිලි පර්යේෂණ ආයතන වාර්තාව නොමැති බවත් නම් ලැස්තුවක් නොමැති බවටත් ප්‍රකාශ කර ඇති බැවින් මේ සම්බන්ධයෙන් ගරු සභාපතිතුමන් විසින් මැදිහත් වී කරුණු සොයා බලන ලෙස ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.මහේන්ද්‍රන් මහතා අදහස් දක්වමින් ආපදා සිදුවන අවස්ථාවේ ලයිම් කාමරයේ පාප්පාත්ති නැමැති පුද්ගලයෙකු පදිංචිව සිටි බවත් මේ වන විට එම පුද්ගලයා මිය ගොස් ඇති බැවින් නිවසක් ලබා දීම සිදුකළ නොහැකි බව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් දැනුම් දී තිබූ බවත් එම පුද්ගලයාගේ දරුවන් විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගොස් සාකච්ඡා කිරීමෙන් අනතුරුව මේ වන විට එකී නිවස ලබාදීමට එකඟතාවය ලබාදුන් බවත් ප්‍රකාශ කරන ලදී. එසේම තාවකාලික කඳවුරේ රැඳී සිටියදී විදුලිය කාන්දු වීම හේතුවෙන් නිවසක් ගිනිගත් බවත් මෙලෙස අවතැන් වූ පුද්ගලයින් සම්බන්ධයෙන් සොයා බලා එකී නිවාස ව්‍යාපෘතිය මේ සම්බන්ධයෙන් සුදුසු පියවරක් ගන්නා ලෙසත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්.සුදර්ශන මහතා අදහස් දක්වමින් 2019 වර්ෂයේ නායයෑමට ලක්වූ මිනිසුන් වෙනුවෙන් වෙන් වූ ලක්ෂ 16ක ප්‍රතිපාදන යටතේ ආරම්භ කරන ලද නිවස ව්‍යාපෘතියේ වැඩකටයුතු නිම කිරීමට නොහැකි වීම හේතුවෙන් වර්තමානය වන විට භාණ්ඩවල මිල ශීඝ්‍රයෙන් ඉහළ යාම හේතුවෙන් අකර්මන්‍ය වූ නිවාස ව්‍යාපෘති මෙන්ම අකර්මණ්‍ය වී ඇති පාලම් වැනි ඉදිකිරීම් කටයුතු එකී නිලධාරින්ගේ හෝ කුමන හෝ අකාර්යක්ෂමතාවයක් හේතුවෙන් නැවත සිදුකිරීමේ දී ඒ වෙනුවෙන් වියදම් වන්නේද මහජන බදු මුදල් බවත්, 2011 වර්ෂයේ සිට ආරම්භ කළ නිවාස ව්‍යාපෘති මේ දක්වා ක්‍රියාත්මක නොවීමට අදාළව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවත් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් හපුතලේ දඹේතැන්න වත්ත , මාවුස්සාගොල්ල කොටස නිවාස ව්‍යාපෘතිය සම්බන්ධයෙන් දිස්ත්‍රික් සංවර්ධන කමිටුවේ දී සාකච්ඡා සිදු කර මේ සම්බන්ධයෙන් කඩිනමින් විසඳුමක් ලබා ගන්නා බව ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව මෙකී ගැටළුව පිළිබඳ විධිමත් කරුණු විමසා බැලීමටත් මෙම අකර්මණ්‍යව ඇති නිවාස ව්‍යාපෘතියේ වැඩ කටයුතු කඩිනමින් අවසන් කර ප්‍රජාව වෙත පවරා දීමට අවශ්‍ය කටයුතු කඩිනමින් සිදු කළ යුතු බවත් ඒ සඳහා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව හා දිස්ත්‍රික්

සම්බන්ධීකරණ කමිටුවට යොමු කිරීම සුදුසු බවත් එසේ යොමු කර තීරණ ලබා ගැනීම සඳහා සභාවේ එකඟතාවය විමසන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 06. කාරක සභා වර්තාව

2022.04.01 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තා සභාව වෙත ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා ගරු සභාවේ එකඟතාවය ලැබිණි.

## 07. ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ

2022 මාර්තු මස ලැබීම් හා වියදම් පිළිබඳ මාසික වාර්තාව සභාව වෙත ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා ගරු සභාවේ එකඟතාවය ලැබිණි.

## 08.වෙනත් කරුණු

### 08.1 ගරු මන්ත්‍රීවරුන්ගේ අදහස් දැක්වීම.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. ඉන්ද්‍රතිලක රාමනායක මහතා අදහස් දක්වමින් 2022 වර්ෂයේ මහ සභා රැස්වීම පවත්වන දිනය ලෙස සෑම මසකම දෙවන සතියේ සිකුරාදා දින පැවැත්වීම සුදුසු බවට පසුගිය මහ සභා වාරයේ දී යෝජනා සම්මත කර ගන්නා ලද අතර 2022-03-14 වන දින සභාව පැවැත්වීම රීති ප්‍රශ්නයක් බැවින් අද දින සභාව පැවැත්වීම වලංගු නොවන බව ප්‍රකාශ කරන ලදී.
ගරු සභාපතිතුමන් මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් සඳුදා දින මහජන දිනය බැවින් මහ සභාව සිකුරාදා දින පැවැත්වීම සුදුසු බවට යෝජනා සම්මත කර ගන්නා ලද අතර අද දින මහ සභාව පවත්වනුයේ 2022 – 03-03 වන දින මුදල් කමිටු තීරණය මත බවත් එහි 2/3 ක නියෝජනයක් ඇති බැවින් රීති ප්‍රශ්නයක් නොමැති බවත් සභාව පැවැත්වීම වලංගු බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී. මහේන්ද්‍රන් මහතා අදහස් දක්වමින් සභාව සම්බන්ධයෙන් අවශ්‍ය තීන්දු තීරණ ලබා ගැනීමේ දී ඒ සඳහා ගරු සභාපතිතුමන් ,සභික මණ්ඩලය මූලික කර ගත යුතු බවත් නීතියට ගරු කළ යුතු බවත් ප්‍රකාශ කරන ලදී.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. සුදත් අරුණ රංජන මහතා ද මේ සම්බන්ධයෙන් වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. සුදත් අරුණ රංජන මහතා අදහස් දක්වමින් 2022 වර්ෂය සඳහා නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුවේ සාමාජිකයෙක් ලෙස තමා පත් කර ඇති බවත් තමා විශ්‍රාමික මිනින්දෝරුවකු ලෙස කටයුතු කරන බැවින් එකී කමිටුව සඳහා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී තංගවේලු මහේන්ද්‍රන් මහතා පත් කරන ලෙසත් තමා 2022 වර්ෂය සඳහා පරිසර හා සෞඛ්‍ය පහසුකම් කමිටු සාමාජිකයෙකු ලෙස පත් කරන ලෙසත් ප්‍රකාශ කරන ලදී.

එසේම පසුගිය කොවිඩ් තත්ත්වය හමුවේ කඩහිමියන් සඳහා සහන ලබා දුන්නද වර්තමානයේ පවතින භාණ්ඩ මිල ඉහළ යාමත්, විදුලිය විසන්ධි කිරීමත් හේතුවෙන් කඩහිමියන්ගේ ආදායම් ඉපයීම පහත වැටී ඇති පසුබිමක උත්සව සමය ළංවීමත් සමඟ දියතලාව නගරය ආශ්‍රිතව පිට

ප්‍රදේශවලින් පැමිණි වෙළඳුන් විසින් අනවසරයෙන් වෙළදාම් සිදු කරන බැවින් නගරයෙහි වෙසෙන කඩහිමියන් අපහසුතාවයට ලක් වන බවත් මාර්ගය දෙපස එලෙස වෙළදාම් කිරීම හේතුවෙන් නගරය තුළ දැඩි රථ වාහන තදබදයක් ද ඇති වන බව ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමන් මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් පිට පළාත් හි වෙළඳුන් මේ වන විටත් පොළෙ හි වෙළදාම් කරන බවත්, නගරය තුළ දෛනිකව වෙළදාම් කරන පුද්ගලයින් හේතුවෙන් සභාවට ආදායමක් ද හිමි වන අතර කරුණු සලකා බලා පිට පළාත්වල වෙළඳුන් සඳහා සීමාකාරී ලෙස අවස්ථාව ලබා දීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශය සභා මන්ත්‍රී කේ.එම්. විමලසිරි මහතා අදහස් දක්වමින් පෙර සභා වාරයන්හිදි යෝජනා ස්ථිර සිදු කරගත් පරිදි හපුතලේ ප්‍රාදේශීය සභාවට අයත් මාර්ගයන් හි බර සීමාව සඳහන් කර දැන්වීම් පුවරු යෙදීම කඩිනමින් සිදු කිරීම සුදුසු බවත් පසුගිය දිනක දී තම වසමට අයත් අලුතෙන් කාපට් යොදන ලද මාර්ගයක බර වාහන ගමන් කිරීම හේතුවෙන් එකී මාර්ගය විනාශ වී ගොස් ඇති බවත් ප්‍රකාශ කළ අතර , චාන්දනී බේකරිය අසල අපද්‍රව්‍ය බැහැර කරන ස්ථානය සම්බන්ධයෙන් සභාවෙ හි මැදිහත් වීම හරහා විසදුමක් ලබා දුන්නා සේම එරණවිල ගම්මානයේ කුකුලන් මරණ ස්ථානයක් පවත්වාගෙන යන බවත් එහි ඉවත් කරනු ලබන අපද්‍රව්‍ය ගඟට ගලා යන බවත් ඒ සඳහා ද සභාව මැදිහත් වී විසදුමක් ලබා දෙන ලෙස ප්‍රකාශ කරන ලදී.එසේම සභාවට අයත් දේපල වසම් මට්ටමින් හෝ පරීක්ෂා කර බලා සභාව සතු සම්පත් පවරා ගන්නා ලෙසත් , පවතින වාතාවරණය හමුවේ අනවශ්‍ය වියදම් කපා හැර මුදල් කළමනාකරණය කිරීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්. සුදර්ශන මහතා අදහස් දක්වමින් දියතලාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වාහන ආදායම් බලපත්‍ර නිකුත් කරනු ලබන ස්ථානයෙ හි එකී සේවාව ලබා ගැනීම වෙනුවෙන් පැමිණෙන සේවාලාභීන් හට ප්‍රමාණවත් පරිදි ඉඩපහසුකම් නොමැති බවත් කොරෝනා වසංගත තත්ත්වය හමුවේ සේවාලාභීන් අතර මීටරයක පරතරයක් සහිතව එහා මෙහා මාරු විය නොහැකි බවත් ප්‍රකාශ කරන ලද අතර මේ පිළිබඳව සලකා බලා කොවිඩ් වසංගත තත්ත්වය හමුවේදි සෞඛ්‍ය ආරක්ෂිතව කටයුතු කිරීම උදෙසා ආදායම් බලපත්‍ර නිකුත් කරනු ලබන ස්ථානයෙ හි ප්‍රමාණවත් ඉඩපහසුකම් සැලසීම පිළිබඳ අවධානය යොමු කර අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

එසේම දියතලාව මධ්‍ය මහ විද්‍යාලය ඉදිරිපිට කැලෑ වැවී ඇති ප්‍රදේශය මේ වන විට සභාවෙ හි මැදිහත් වීම මත එකී කැලෑ කොටස කපා ඉවත් කිරීම සම්බන්ධයෙන් ස්තූතිය ප්‍රකාශ කර සිටි අතර කපා ඉවත් කරන ලද කොටස් මාර්ගයට පතිත වී ඇති බැවින් එකී කොටස් ට්‍රැක්ටර් රථයක් හෝ යොදාගෙන එකී සුන්බුන් ඉවත් කර සුද්ධ පවිත්‍ර කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

එසේම දියතලාව සුසාන භූමිය මෙන්ම දොඩම්වත්ත සුසාන භූමිය මේ වන විට ප්‍රජාවගේ නොසැලකිලිමත් භාවය හේතුවෙන් කැලිකසල දැමීම වැනි කාරණා හේතුවෙන් අපිරිසිදු වී ඇති බවත් මීට පිළියමක් ලෙස දැන්වීම් පුවරු හෝ ස්ථාපනය කිරීම සුදුසු බවත් එසේම සුසාන භූමිවල මායිම් ලකුණු කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

එසේම කොස්ගහකුඹුර - දියතලාව මාර්ගයේ ඉදි කෙරෙමින් පවතින පාලම හේතුවෙන් ප්‍රජාව බොහෝ අපහසුතාවයට ලක්වන බවත් මරණයක් සිදු වූ විට අවසන් කටයුතු සිදු කිරීමට රැගෙන යාමේ දී ගම හරහා මාර්ගය භාවිතා කිරීමට සිදු වීමෙන් ඉතා විශාල වියදමක් දැරීමට සිදුවන බැවින් මේ පිලිබඳව අවධානය යොමු කරවන ලෙසත් වර්තමානයේ ආර්ථිකය හේතුවෙන් රට තුළ අභාගය සම්පන්න තත්ත්වයක් මතු වී ඇති බවත් වතු කම්කරුවන් ඇතුලු සියලුම ජනතාව ඉතා අපහසුවෙන් ජීවත් වන බවත් පෙට්‍රල් , සහල් ඇතුලු භාණ්ඩවල මිල දිනෙන් දින ඉහළ යන බැවින් යම් කිසි හෝ සහනයක් ලබා දීමට කටයුතු සිදු කරන ලෙසත් පෙට්‍රල් මිල ගණන් දිනෙන් දින ඉහළ යාම හේතුවෙන් ත්‍රී රෝද ප්‍රවාහන ගාස්තු ද ඉතා ඉහළ අගයක් ගන්නා බැවින් මේ පිලිබඳ අවධානය යොමු කර දොඩම්වත්ත මාර්ගයේ බස් රථයක් ධාවනය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර දෙනමෙන් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ජී.ලියෝ කැමිලස් ප්‍රනාන්දු මහතා අදහස් දක්වමින් දොඩම්වත්ත මාර්ගයේ බස් රථය ධාවනය කිරීමට ඉඩකඩ අවශ්‍ය ප්‍රමාණයට නොමැති බව දැන් වූ හෙයින් එකී අවශ්‍ය පරිදි මාර්ගය හා කාණු පද්ධතිය සාදා අවසන් කර දුන්න ද මේ වන තෙක් බස් රථය ධාවනය කිරීමක් සිදු නොවන බව ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි එල්.එච්.ඉංදික සම්පත් මහතා අදහස් දක්වමින් දියතලාව නගරය තුළ නිදැල්ලේ සැරිසරණ ලද ගවයන් රැගෙන ගොස් තිරුක්කෝවිල් ප්‍රදේශයට භාර දුන් අතර එම ගවයන් සම්බන්ධයෙන් පසුවිපරමක් සිදු කල යුතු බවත් පහළ කඳුරුගමුව මිහිඳු විද්‍යාලය අසලින් ගමන් කරන බස්රථය ධාවනය නොවන බවත් ලංගම මගීන් බස් රථ ධාවනය සිදු කරනු ලබන්නේ ආදායම් හිමි මාර්ගවල පමණක් බවත් ප්‍රජාවගේ පහසුව තකා මෙවැනි අඩු ආදායම් සහිත මාර්ගවල බස් රථ ධාවනය කිරීමට රජය හෝ පෞද්ගලික අංශය මැදිහත් විය යුතු බවත් මේ සම්බන්ධයෙන් ප්‍රවාහන අමාත්‍යාංශය හෝ දැනුවත් කිරීමට ගරු සභික මණ්ඩලය විසින් අදහස් ප්‍රකාශ කළ බව මාධ්‍ය හරහා පළ කිරීමට කටයුතු සිදු කරන ලෙස මාධ්‍යවේදීතුමාගෙන් ඉල්ලා සිටින බව ප්‍රකාශ කරන ලදී.එසේම තම කොට්ඨාසයේ කඳුරුගමුව -යහල බැද්ද පූට්ටු පාලම අසල කුඹුර මේ වන විට මාර්ගය දෙසටම හාරා ඇති බැවින් ඒ සම්බන්ධයෙන් පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමන් මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් නැවත වරක් නිදැල්ලේ සැරිසරණ ලද ගවයන් අල්ලා ගෙන ගොස් භාර දීමට මේ වන විට මූලික කටයුතු ආරම්භ කර ඇති බවත් පළමු අදියර යටතේ භාර දුන් ගවයන් සම්බන්ධයෙන් පසු විපරමක් සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි පී.මහේන්ද්‍රන් මහතා අදහස් දක්වමින් දඹේතැන්න ආගරපතන වතුයායේ තේ දළුවල බර කිරීමේ දී භාවිත කරනු ලබන ඩිජිටල් තරාදිය මගින් තේ දළු කිරීමේ දී කිලෝ ග්‍රෑම් දෙකක් පමණ වංචාවක් සිදු වන බවත් මේ සම්බන්ධයෙන් වතු කම්කරුවන් දැඩි අපහසුතාවයට පත් වී ඇති බවත් ඔවුන් ඒ වෙනුවෙන් වෘත්තීය ක්‍රියා මාර්ගවලට පවා එළඹී ඇති බවත් ප්‍රකාශ කරන ලදී.මේ සම්බන්ධයෙන් වතු කම්කරුවන් මුහුණ දී ඇති ගැටලුකාරී තත්ත්වය මඟ හරවා ගැනීම හා ඔවුන්ගේ රැකියා සුරක්ෂිතභාවය තහවුරු කිරීම සඳහා හපුතලේ , කම්කරු

කොමසාරිස්තුමන් සමඟ සාකච්ඡාවක් සිදු කිරීම සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු කඩිනමින් සිදු කර දෙන මෙන් ඉල්ලා සිටින බව ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමන් මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් වතු කම්කරුවන් මුහුණ දී ඇති ගැටලුකාරී තත්ත්වය මඟ හරවා ගැනීම හා ඔවුන්ගේ රැකියා සුරක්ෂිතභාවය තහවුරු කිරීම සඳහා හපුතලේ , කම්කරු කොමසාරිස්තුමන් සමඟ සාකච්ඡාවක් සිදු කිරීම සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කර දෙන බව ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.මහේන්ද්‍රන් මහතා වැඩිදුරටත් අදහස් දක්වමින් ග්ලැනනෝර් , බ්ලැක්වුඩ්, විහාරකැලේ වතු යායේ ජීවත් වන පුද්ගලයින් තිදෙනෙකු හට පසුගිය දිනයකදී ඉඩම් ලබා දී ඇති බවත් එකී මිනිසුන් විසින් නිවස ඉදි කිරීම සඳහා අදාල භූමිය සුද්ධ කිරීමට යාමේ දී එහි අයිතිකරු පැමිණ යම් ගැටලුවක් වූ බවත් එකී ඉඩම සඳහා අලුතෙන් ඔප්පු ලබා දී ඇත්තේ ග්‍රාම නිලධාරිතුමන්ගේ හා සමෘද්ධි නිලධාරිතුමන්ගේ මැදිහත් වීම මත බවත් තොරතුරු දැනගත් පරිදි මෙසේ ඔප්පු සකසා ඇත්තේ දීර්ඝ කාලීන බදු ඉඩම් බලපත්‍ර නිකුත් කරන ආයතනයේ (LRC) ලේකම් බවත් ඔහු මින් පෙර ජනාධිපති පෞද්ගලික ලේකම් බවත් ජනාධිපති විධායක බලතල යටතේ මෙසේ ඔප්පු ලබා දුන් බවත් එසේ ලබා ගත් ඉඩම් වතු ප්‍රජාවට අඩි 10ක් වන පරිදි ලයම් කාමරයක් ලබා දී වසම භාර රජයේ නිලධාරියා නැතහොත් ග්‍රාම නිලධාරිතුමා විසින් ඉඩම අත්පත් කර ගන්නා බවත් එකී කාරණය ලැජ්ජා සහගත බවත් මේ සම්බන්ධයෙන් වතු අධිකාරිතුමන් දැනුවත් කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති වයි.එම්. නිමල් අමරසිරි මහතා අදහස් දක්වමින් දියතලාව යුධ හමුදා කඳවුරු පරිශ්‍රයේ ෆොක්ස්හිල් වන වගාවේ හෙක්ටයාර 42.0 ක පිහිටි පයිනස් ගස් 23,348 ක ප්‍රමාණය කඩිනමින් කපා ඉවත් කර ගැනීමේ අවශ්‍යතාවය මත එකී දැව ප්‍රවාහනය සඳහා මැණික්කන්ද / අඹේගොඩ මාර්ගය භාවිතය සඳහා අනුමැතිය 2022-2-11 වන දින පැවති මහ සභා රැස්වීම් වාරයේ දී ලබා නොදුන් අතර යුධ හමුදා කඳවුර හරහා විකල්ප මාර්ගයක් ඉදි කර ගන්නා ලෙස තීරණය වුවද මේ වන විට පයිනස් ගස් කැපීම සිදු කරන බවත් එකී දැව කඳන් නො-09 ස්ථානයට ගෙනවිත් දමා ඇති බව දුටු බවත් එක් ලොරි රථයක් යොදා ගනිමින් ප්‍රවාහන කටයුතු සිදු කරන බව තමාට දැන ගැනීමට ලැබුණු බවත් ප්‍රකාශ කළ අතර ඒ හේතුවෙන් මාර්ගය පලුදු වී ඇති බවත් මෙය යුධ හමුදා කඳවුරට අයත් මාර්ගයක් නොවන බවත් මේ සම්බන්ධයෙන් සොයා බලා එය වැළැක්වීමට පියවර යොදවන ලෙසත් ප්‍රකාශ කරන ලදී.

එසේම තම වසම තුළ මේ වන විට අනවසර ඉදි කිරීම් හතරක් ආරම්භ කර සිදු කර ඇති බවත් මෙවැනි අනවසර ඉදි කිරීම් නතර කිරීමට කටයුතු සිදු කළ යුතු බවත් ප්‍රකාශ කළ අතර ඒ අතර රංජල්ලාව ප්‍රධාන පාරේ පැති බැම්මක් අනවසරයෙන් ඉදි කර ඇති බවත්, සුසාන භූමියෙහි ද මායිම ප්‍රජාව විසින් අයිති කර ගැනීමට කටයුතු සිදු කරන බවත්, මැණික් කන්ද හරහා කහත්තේවෙල මාර්ගයේ කාණු පද්ධතිය අල්ලා බැම්මක් ඉදි කර ඇති බවත්, මැණික්කන්ද ප්‍රධාන පාරේ කාණු පද්ධතිය හරහා බැම්මක් ඉදි කර ඇති බවත්, මෙම කරුණු හතර පිළිබඳ කාර්මික නිලධාරි නිරීක්ෂණයට ලක් කර අනවසර ඉදි කිරීම් බැවින් නතර කිරීමට වාර්තා ලබා දුන්නද මේ වන විට සියල්ල ඉදි කර ඇති බවත් මෙවැනි ක්‍රියා සම්බන්ධයෙන් විසඳුමක් ලබා ගත යුතු බවත් මෙකී අනවසර ඉදි කිරීම් සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවක් ලෙස ක්‍රියාත්මක විය යුතු බවත් පුද්ගලයන් දැනුවත් කිරීමට කටයුතු සිදු කළ යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. සුදත් අරුණ රංජන මහතා අදහස් දක්වමින් සභාව විසින් තීරණයක් ගෙන අනවසර ඉදි කිරීම් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී එකී අනවසර ඉදි කිරීම නතර කරන ලෙසට දින 07 ක කාලයක් ලබා දිය යුතු බවත් දින 07 කට පසුවද එය ඉවත් කර ගැනීමක් සිදු නොවන්නේ නම් එකී සියලු උපකරණ සභා විසින් රැගෙන විත් සභාව සතු කර ගැනීම සුදුසු බවත් මෙය අනාගතයට විශාල ගැටලුවක්ව පවතින කාරණාවක් බවත් පෙන්වා දෙන ලදී.

ගරු සභාපතිතුමන් මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් අනවසර ඉදි කිරීම් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී එකී අනවසර ඉදි කිරීම නතර කරන ලෙසට කාලයක් ලබා දිය යුතු බවත් නොඑසේ නම් ඉවත් කර ගැනීමක් සිදු නොවන්නේ නම් එකී සියලු උපකරණ සභා විසින් රැගෙන විත් සභාව සතු කර ගැනීම සුදුසු බවත් සභාව විසින් ඉදි කිරීම් නතර කිරීමට කාර්මික නිලධාරි මහතා වාර්තා ලබා දී තිබිය දී ද එසේ ඉදි කිරීම් සිදු කරන්නේ නම් ඒ සම්බන්ධයෙන් ඉදිරි පියවර ගැනීම කඩිනම් කළ යුතු බව ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති වයි.එම්. නිමල් අමරසිරි මහතා තව දුරටත් අදහස් දක්වමින් නො .09 හංදියෙ හි ත්‍රී වීල් රථ ගාලෙහි නව ත්‍රී රෝද රථයක් ඇතුළත් කිරීම සඳහා ඉල්ලීමක් සිදු කරනු ලබන බවට තොරතුරු ලැබී ඇති අතර මේ වන විට ත්‍රී රෝද රථ 20ක් තිබෙන බැවින් අලුතෙන් රථයක් ඇතුලත් කිරීමට ඉඩ නොමැති බවත් ඉන්ධන පිරවුම් හල හේතුවෙන් එකී ස්ථානයෙ හි දැඩි රථ වාහන තදබදයක් මෙන්ම රිය අනතුරු සිදු වීම් ද වැඩි වී ඇති බව ප්‍රකාශ කරන ලදී. එසේම සභා අරමුදල් මගින් පසුගිය වසරේ ආරම්භ කරන ලද සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කිරීමේ දී භාණ්ඩ මිල ගණන් දිනෙන් දින ඉහළ යාම නිසා ඉදිරියේ දී එකී ව්‍යාපෘති සඳහා කුමක් කරන්නේ ද යන්න පිළිබඳ පොදු තීරණයක් ලබා ගත යුතු බවත් ප්‍රකාශ කරන ලදී.එසේම අවසන් වශයෙන් පොදු මාර්ග / ගම් සබා මාර්ග ආරක්ෂා කර ගැනීමට කටයුතු සිදු කල යුතු බවද ප්‍රකාශ කරන ලදී.

මෙදින සභා රැස්වීම ප.ව.12.00ට අවසන් විය.

## <u>සංශෝධන</u>

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී. මහේන්ද්‍රන් මහතා විසින් දෙමළ භාෂාවෙන් මුද්‍රණය කරන ලද සභා වාර්තාවෙ හි එතුමන් විසින් යෝජනා අංක 02 යටතේ අදහස් දක්වන ලද හපුතලේ දඹේතැන්න වත්ත මාවුස්සාගොල්ල කොටස නිවාස ව්‍යාපෘතියෙ හි අත්තිවාරම් මට්ටමට ගෙවල් 34 ක් හා ලින්ටන් මට්ටමට ගෙවල් 311 ක් මේ වන විට ඉදි කිරීම් කටයුතු සිදු කර ඇති බව සඳහන් බවත් ලින්ටන් මට්ටමට ගෙවල් 311 නොව එය 31 ලෙස සංශෝධනය විය යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

බී. කන්දසාමි,
සභාපති,
හපුතලේ ප්‍රාදේශීය සභාව.